සැ.යු. 2019.09.06 දින පළ වූ අංක 2140 දරන ගැසට් පත්‍රයේ III කොට පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,141- 2019 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 188 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 189 |


*සැ. යු.* -(i) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 04 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


187- B 081559 - 353 (2019/09)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ගෙදපළාවේ ගෙදර නිහාල් ගුණරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1943 ක් වූ මාර්තු මස දහවන දින ප්‍රදානය කර ඇති අංක ආර් 1886 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බණ්ඩාරවෙල, කිණිගම පදිංචි ඉම්හාමි මුදියන්සේලාගේ සියාතු මයා වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක **L.D.O. VOL/2** යටතේ 1948.03.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019/10/11 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත පත්තුවේ/කෝරළේ කිණිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිණිගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත **අංක 06** දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි **අංක 19** දරන කට්ටි කැබීමේ පිඹුරේ/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ......... දරන රේඛා සටහනේ **අංක 157** දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 39 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම **බෝගහඇල්ල පතන.**

| | |
|---|---|
| උතුරට | : අ.ග.පි.19 හි කැබලි අංක 156 ; |
| නැගෙනහිරට | : කිතල් ඇල්ල ඔය රක්ෂිතය ; |
| දකුණට | : අ.ග.පි.19 හි කැබලි අංක 158 ; |
| බස්නාහිරට | : ඇල රක්ෂිතය. |

ජී. ජී. එන්. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2019 ජුනි මස 11 වැනි දින.

09-308/1

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ගෙදපළාවේ ගෙදර නිහාල් ගුණරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් **1996 ක්වූ නොවැම්බර් මස පස්වන** දින ප්‍රදානය කර ඇති අංක බදු/ප්‍ර **27945** දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන බණ්ඩාරවෙල, කිණිගම , කන්දෙඅරාව , පාසැල්පතන පදිංචි **රත්නායක මුදියන්සේලාගේ අප්පුහාමි** වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක **L.D.O. 3872** යටතේ 1997.05.20 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූල හිමි ඇති අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු / ඇය අනුප්‍රාප්තිකයෙකුවීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019/10/11 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත කෝරළේ එගොඩගම, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිණිගම (**අ.ග.සි 19**) නමැති ගමේ පිහිටා ඇත්තා වූ ප්‍රමාණයෙන් **පර්චස් 20 ක්** විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම **පාසල්පතන**

| | |
|---|---|
| උතුරට | : කඳුර රක්ෂිතය ; |
| නැගෙනහිරට | : ගම්සහා පාර රක්ෂිතය ; |
| දකුණට | : දිසානායකගේ ඉඩම ; |
| බස්නාහිරට | : කඳුර රක්ෂිතය. |

ජී. ජී. එන්. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2019 ජුනි මස 11 වැනි දින.

09-308/2

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* :4/10/54661
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L4/M/04

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 59 ඇකිරිකන්ද ග්‍රාම නිලධාරී වසමේ, ඇකිරිකන්ද ගමේ - කැබලි අංක 01 හි ප්‍රමාණයෙන් පර්චස් 27 අදාළව රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ කටයුතු සඳහා භානුකා ධරණි සෙනරත් මිය වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :-

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රාදේශීය සභා පාර රක්ෂිතය; |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම් (ප්‍රජා ශාලාව පිහිටි ඉඩම); |
| *දකුණට* | : ඒ.පී. අබේසේකරගේ ඉඩම; |
| *බටහිරට* | : නිශ්ශංක ගුණතිලකගේ ඉඩම. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(*අ*) බදු කාලය .- අවුරුදු තිහයි. (30) (2018.05.18 වැනි දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩු වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2018 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000)ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල .- වාර මුදලක් අය නොකෙරේ.

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(*ඉ*) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය,

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(*උ*) 2018.05.18 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(*ඌ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
"මිහිකත මැදුර",
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-307

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* :4/10/58327
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* :
NP/28/04/02/ SLO/45/1440

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ**

**කෙරෙන නිවේදනය**

කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුලංගාවිල් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මුලංගාවිල් ගමේ ජනපද නිලධාරි විසින් අදින ලද අනුරේඛණයේ ප්‍රමාණයෙන් අක්කර 1/2 ක් පමණ වු රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා විනායහපුරම් ගොවි සමූපාකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම; |
| *නැගෙනහිරට* | : | A - 32 මාර්ගය; |
| *දකුණට* | : | පොළිස් ස්ථානයේ (මුලංගාවිල්); |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(*අ*) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.07.08 වැනි දින සිට වැනි දින 2049.07.07 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කල වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%.

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහ හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(*ඉ*) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය,

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබෙ,

(*උ*) 2019.07.08 වැනි දින සිට වසර 5ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවැරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(*ඌ*) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ජී. ප්‍රනවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-309

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/36350
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NP/28/04/02/
SLO/45-NP PDCO

**අංක 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ**

**කෙරෙන නිවේදනය**

කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් KN 08, බාරදීපුරම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, 155 කණුව,

ගමේ KR/LB/NP-PDCO//2012 දරන දළ අනුරේඛනයේ කැබලි අංක 1 හි දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 1/2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා උතුරු පළාතේ, සීමාසහිත තල්, පොල්, සංවර්ධන පොකුරු සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම; |
| *නැගෙනහිරට* | : | A - 09 මාර්ගය; |
| *දකුණට* | : | රජයේ ඉඩම (PDCO); |
| *බටහිරට* | : | දුම්රිය මාර්ගය. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(*අ*) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2019.07.08 වැනි දින සිට 2049.07.07 දක්වා) ;

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කල වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%;

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහ හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(*ඉ*) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය;

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(*උ*) 2019.07.08 වැනි දින සිට වසර 5ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

(*ඌ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ජී. ප්‍රනවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
"මිහිකත මැදුර", 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-310

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/56953
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NP/28/04/02/ SLO/44/1370

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුල්.95 කෝයිල්කුඩියිරුප්පු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෝයිල්කුඩියිරුප්පු ගමේ රජයේ මිනින්දෝරු බී. නවජීවන් විසින් අඳින ලද MU/DSO/2015/093 අනුරේඛණයේ හි කැබලි අංක G දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 1012 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා මහජන බැංකුව - කෝයිල්කුඩියිරුප්පු විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම; |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන වීදිය; |
| *දකුණට* | : | රජයේ ඉඩම; |
| *බටහිරට* | : | රජයේ ඉඩම. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(*අ*) බදු කාලය .- අවුරුදු තිහයි (30) (2019.07.08 වැනි දින සිට 2049.07.07 වැනි දින දක්වා)

වාර්ෂික බදු මුදල .- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරුව වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන

අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකම 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකල වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(*ඉ*) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය,

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(*උ*) 2019.07.08 වැනි දින සිට වසර 5ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවැරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(*ඌ*) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ජී. ප්‍රණවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 සැප්තැම්බර් මස 12 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-311

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.